රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක : 03/2003

මගේ අංකය: ට1/92/1/2003
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
අංක: 46, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.
2003 නොවැම්බර් මස 28 දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත්සභා ප්‍රධාන ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම

17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 55 (3) වගන්තිය ප්‍රකාර සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් පිළිබඳ පත්කිරීම්, උසස්කිරීම්, ස්ථානමාරු කිරීම්, විනය පාලන කටයුතු සහ සේවයෙන් පහකිරීම් අමාත්‍ය මණ්ඩලය වෙත පැවරී තිබෙන අතර අමාත්‍ය මණ්ඩලය විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අදහස් විමසීමෙන් පසු එකී බලතල ක්‍රියාත්මක කරනු ඇත. අනෙකුත් රාජ්‍ය නිලධාරීන් පිළිබඳ පත්කිරීම්, උසස්කිරීම්, ස්ථානමාරු කිරීම්, විනය පාලන කටයුතු සහ සේවයෙන් පහකිරීම් 55 (1) වගන්තිය ප්‍රකාර, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පැවරී තිබේ.

02. මේ අනුව, අමාත්‍යාංශවල අතිරේක ලේකම්වරුන්, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් පත්කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පැවරී තිබේ. ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 4:1 වගන්තිය ඒ අනුව සංශෝධනය කිරීමට ක්‍රියා කරනු ලැබේ. තෝරා ගැනීම පිළිබඳ උපමානයන් අදාළ බලධරයන් සමඟ සාකච්ඡා කිරීමෙන් පසු රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත.

03. නිත්‍ය සේවක සංඛ්‍යාවට අයත් තනතුරු පිරවීම සඳහා විශේෂඥයන් සහ උපදේශකයන් පත්කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පැවරී ඇති අතර අනුමත සේවක සංඛ්‍යාවෙන් බාහිර තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත පත්කිරීම් අමාත්‍ය මණ්ඩලය විසින් කරනු ඇත.

04. රාජ්‍ය සේවයෙන් පරිබාහිර සේවය සඳහා (රාජ්‍ය ව්‍යවසාය/ව්‍යාපෘතිවලට) මුදාහැරීම ප්‍රථම වරට අවුරුදු දෙකක (02) කාලසීමාවක් සඳහා වනු ඇත. සේවා අවශ්‍යතාවය මත හෝ සුදුසු අනුප්‍රාප්තිකයෙකු සොයා ගැනීමේ දුෂ්කරතාවය මත තවත් කාලසීමාවකට එවැනි නිලධාරියකුගේ සේවය යම් රාජ්‍ය ව්‍යවසායකට/ව්‍යාපෘතියකට අවශ්‍ය වේනම් තවදුරටත් දීර්ඝ කිරීමක් සඳහා ඉල්ලීමක් එම රාජ්‍ය ව්‍යවසාය/ව්‍යාපෘතිය විසින් විෂයභාර අමාත්‍යාංශ ලේකම් මඟින් අදාළ පත්කිරීම් බලධරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර එය සලකා බලන බලධරයා ඉල්ලීම සාධාරණ නම් සේවා දීර්ඝ කිරීමක් ලබාදෙනු ඇත. එවැනි දීර්ඝ කිරීමක කාලසීමාව වරකට අවුරුද්දක් නොඉක්මවිය යුතු අතර උපරිමයක් වශයෙන් මුළු කාලසීමාව අවුරුදු 05 කට වැඩි නොවිය යුතුය.

.. 2/

05. දෙපාර්තමේන්තු ප්‍රධානීන් හැර රාජ්‍ය සේවයේ අනුමත සේවක සංඛ්‍යා තනතුරුවලට විශ්‍රාමික නිලධාරයන් පත්කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පැවරී තිබේ. මේ අනුව ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 9:1 වගන්තිය සංශෝධනය කරනු ඇත.

06. 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 59 වන ව්‍යවස්ථාව ප්‍රකාර, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද යම් නියෝගයක් හෝ තීරණයක් වෙනස් කිරීමට, මාරුකිරීමට හෝ අවලංගු කිරීමට පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත බලය පැවරී ඇත. පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය දැනට පිහිටවනු ලැබ ඇති බැවින් එවැනි අභියාචනා එම විනිශ්චය අධිකාරය මගින් සලකා බලනු ඇත. ඒ අනුව ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ XLVIII වන පරිච්ඡේදයේ 26:10 සහ 26:12 වගන්ති මේ අනුව සංශෝධනය කරනු ලැබේ.

07. ඉහත සඳහන් උපදෙස් වහාම ක්‍රියාත්මක වන පරිදි පිළිපදින ලෙස සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත නියම කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි.

(එච්.ඩී.එල්.ගුණවර්ධන)
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

පිටපත් : 1. අග්‍රාමාත්‍ය ලේකම්.
2. අමාත්‍ය මණ්ඩල ලේකම්.

ද/24